සියළු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය

## ගම්පහ අධ්‍යාපන කලාපය
## Gampaha Education Zone

### දෙවන වාර ඇගයීම - 2025
### Second Term Evaluation - 2025

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade: 10 | විෂයය Subject: කතෝලික ධර්මය | කාලය Time: පැය 02 |

### I කොටස

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(1) දේව අනාවරණයේ මූලාශ්‍ර ගණන වන්නේ,
   1. 4 කි.
   2. 3 කි.
   3. 2 කි.
   4. 5 කි.

(2) පංච පුස්තකය හඳුන්වන වෙනත් නමක් වන්නේ,
   1. ඉතිහාස පොත්
   2. නීති පොත්
   3. ප්‍රඥා සාහිත්‍යය
   4. දිවැසිවර ග්‍රන්ථ

(3) පුද්ගලයන්ගේ හෝ ජනතාවගේ ගැටළුවලට විසඳුම් දේව වේදීය දෘෂ්ටි කෝණයකින් ඉදිරිපත් කරන පොත් වන්නේ,
   1. රූත් සහ එස්තර්
   2. එස්ර හා නෙහෙමියා
   3. ජෝෂුවා හා වීරාවලිය
   4. ජෝබ් හා ගීතාවලිය

(4) කතෝලික ධර්මය පදනම් වී ඇත්තේ,
   1. ජීවන සහා සම්ප්‍රදාය මතය.
   2. වාචික සම්ප්‍රදාය මතය
   3. ආගමික ඉතිහාසය මතය
   4. දේව වචනය මතය.

(5) අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොත රචනාවී ඇති කාලවකවානුව වන්නේ,

1. ක්‍රි.ව. 70 – 80 අතර කාලයේ ය.
2. ක්‍රි.ව. 80 – 90 අතර කාලයේ දී ය.
3. ක්‍රි.ව. 90 – 100 අතර කාලය් දී ය.
4. ක්‍රි.ව. 60 – 70 අතර කාලයේදී ය.

(6) සිරගතව සිටින විට ශු.පාවුළුතුමා කිතුනු බැතිමතෙකුට පෞද්ගලිකව ලියන ලද ලිපිය වන්නේ,

1. තීතස්
2. සීලස්
3. පිලමොන්
4. 1 තිමති

(7) ‘‘සැඟව තිබූ යමක් ප්‍රකාශ වීම’’ යන ග්‍රීක අර්ථය යෙදෙන වචනය වන්නේ,

1. අනාවරණය
2. එළිදරව්ව
3. දේවානුභාවය
4. දේව මැවිල්ල

(8) ජුදා ජාතිකයන් දරුණු පීඩනයට ලක්ව සිටි සමයේ ක්‍රි.පූ. 580 දී සිටි පුද්ගලයෙකි.

1. දානියෙල්
2. යෙසායා
3. ජෙරමියා
4. එසකියල්

(9) යහපතින් අයහපත වෙන්කර හඳුනාගෙන, යහපත කිරීම,

1. ආධ්‍යාත්මිකත්වයයි.
2. ප්‍රඥාවයි.
3. එළිදරව්වයි
4. අනාවරණයයි

(10) ප්‍රඥාව ඉල්ලා යාච්ඤා කළ බැවින් දෙවියන් වහන්සේගෙන් යස ඉසුරුද ලැබූ රජතුමාවන්නේ,

1. දාවිත් රජ
2. සාමුවෙල්
3. සාවුල් රජ
4. සලමොන් රජ

(11) ‘‘හොක්මා’’ යන්නෙහි අර්ථය වන්නේ,

1. සාර්ථකව හා ධර්මිෂ්ඨව ජීවත්වීමේ හැකියාවයි.
2. යහපතින් අයහපත වෙන්කර ගැනීමයි.
3. හොඳ නරක අවබෝධ කර ගැනීමයි.

4. ධාර්මිෂ්ඨව ජීවත්වීමයි.

(12) ජේසුස් වහන්සේ අයිති පාලන ප්‍රදේශය වන ගලීලය අයිතිවූයේ,

1. පිලාත්ට ය.
2. පිලිප්ටය
3. හෙරෝද් ඇන්ටිපස්ටය
4. හෙරෝදියස්ට ය.

(13) ජේසුස් වහන්සේව ද උන් වහන්සේගේ දෙපසින් සොරුන් දෙදෙනෙකුව කුරුසියේ ඇණ ගසනු ලැබුවේ කුමන ස්ථානයට පැමිණි විටද ?

1. කයිසාරියට
2. කපාල පිටියට
3. පිලිප්පියට
4. අකයියාවට

(14) නව අහස සහ නව පොළොව අත්කර ගැනීමට අප විසින් කළ යුත්තේ,

1. පාපාච්චාරණය කිරීමයි.
2. පැවිදි දිවියට ඇතුළුවීමයි.
3. පූජක දිවියට ඇතුළුවීමය.
4. පාපක්‍රියා අතහැර යාච්ඤාවෙන් දිවි ගෙවීමයි.

(15) ‘‘පෙන්තකොස්ත මංගල්‍යය’’ ලෙස හඳුන්වන්නේ ,

1. දෙවිඳුන්ට වන්දනා කරන මංගල්‍යයකි.
2. දෙවිඳුන්ට තුති දීමේ මංගල්‍යයකි.
3. දෙවිඳුන් හා සමඟි වන මංගල්‍යයකි.
4. දෙවිඳුන්ට ප්‍රශංසා කරන මංගල්‍යයකි.

(16) ශුද්ධාත්ම වරම් ලැබූ තැනැත්තකු සමාන කළ හැක්කේ,

1. දේව දූතයකුට ය.
2. දිවැසිවරයකුට ය.
3. හමුදා භටයකුට ය.
4. එඬේරෙකුට ය.

(17) ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පූර්ණ වූ කිතුනුවා මනා සූදානමකින් හා ආයුධ සන්නද්ධව සිටිය යුත්තේ,

1. විශ්වාසයට එරෙහිව පැමිණෙන අභියෝග ජය ගැනීමට
2. නපුර පරාජය කරීමට
3. සතුරන් පරාජය කිරීමට
4. තමන්ට විරුද්ධවන්නන්ට එරෙහිවීමට

(18) පාවුළුතුමා සිය ජීවිතයේ වෙනසක් ලැබුවේ,

1. දමස්කයට ගිය පසුය.
2. කිතුනුවන්ට පීඩා කළ පසුය.

3. උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේව හඳුනාගත් පසුය.
4. සිරගත වූ පසුවය.

(19) තුන්වන ධර්මදූත චාරිකාවෙන් පසු පාවුළුතුමා නැවතී සිටි නගරය වූයේ,
1. ග්‍රීසියේ ය.
2. එපීසයේ ය.
3. ඇතැන්ස් ය.
4. ජෙරුසලමේ ය.

(20) ''එහෙත් ඔබ කියන සේක් නම් දැල් හෙළමි'' ය පවසන ලද්දේ,
1. ඇන්ඩෲ ය.
2. පේදුරුතුමා ය.
3. ජොහාන් ය.
4. මතියස් ය.

(21) ''මා මෙසේ කරන්නේ ඔබ මා තුළ ද මා ඔබ තුළද සිටින්නාක් මෙන්, ඔවුන් ද අප තුළ ............................................. වන පිණිස ය.'' මෙහි හිස්තැනට සුදුසු වන්නේ,
1. ශුද්ධත්වයක්
2. කතෝලිකත්වයක්
3. අපෝස්තලිකත්වයක්
4. ඒකත්වයක්

(22) භක්ති අභ්‍යාසයක් ලෙස සළකන්නේ,
1. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීම
2. පාපොච්චාරණය කිරීම
3. වන්දනා ගමන් යාම
4. අභිවෘද්ධි ආලේපය ලැබීම.

(23) ඔක්තෝම්බර් 10 වන දින ශු.දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා විසින් ශුද්ධවරයට ඔසවන ලද්දේ,
1. මැක්සිමිලියම් කෝල්බේ මුනිතුමා
2. තෙරේසා මව්තුමිය
3. මයිකල් රුද්‍රිගු පියතුමා
4. ෆැන්සිස් ශුද්ධෝත්තම පියතුමා

(24) ජුදා සිනගෝගයකට වැඩම කළ ශුද්ධෝත්තම පියතුමා වන්නේ,
1. VI වන පාවුළු ශුද්ධෝත්තම පියතුමා
2. XXIII ජුවාම් ශුද්ධෝත්තම පියතුමා
3. II වන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා
4. ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා

(25) ඇල්බේනියාවේ උපත ලැබුවේ,
1. තෙරේසා කන්‍යාව
2. තෙරේසා මව්තුමිය

3. මරියා ගොරෙට්ටිතුමිය
4. මේරි යුප්‍රේසියාතුමිය

(26) ඒඩ්ස් රෝගීන් සඳහා පළමු නිවහන නිව්යෝක් නගරයේ ආරම්භ කරන ලද්දේ,
1. තෙරේසා මව්තුමිය
2. මැක්සිමිලියම් කෝල්බේ මුනිතුමා
3. මයිකල් රුද්‍රිගු පියතුමා
4. දෙවන ජුවම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා

(27) 1543 දී මෙරටට පැමිණි පළමු ධර්මදූත කණ්ඩායම වන්නේ,
1. ෆැන්සිස්කාන  නිකාය
2. දොමිනිකාන නිකාය
3. අගුස්තීනු නිකාය
4. ජේසු නිකාය

(28) ජේසුස් වහන්සේගේ කුරුසිය උසුලාගෙන යාමට සහාය වූයේ,
1. රෝම සොල්දාදුවන් ය.
2. සීමොන් පේදුරු ය.
3. නිකදේමුස් ය.
4. සිරේනියේ සීමෝන් ය.

(29) ජේසුස් වහන්සේ ගෝලයින්ගේ පාද සේදීමේ සිද්ධිය ගෙනහැර දක්වන එකම සුබාරංචිය වන්නේ,
1. ශු.ලූක් සුබාරංචිය
2. ශු.ජොහාන් සුබාරංචිය
3. ශු.මතෙව් සුබරංචිය
4. ශු.මාක් සුබාරංචිය

(30) ලන්චියානෝ නුවර ප්‍රාතිහාර්ය වූ මස් කැබැල්ලත්, ටියුරින් නුවර සිරි සළුවත් එක හා සමාන ලේ වර්ගයක් වන අතර එම රුධිරය වර්ගය වන්නේ,
1. A
2. B
3. AB  පොසිටිව්
4. O  පොසිටිව්

(31) පුරාණ ගිවිසුමේ පළමුවරට පූප හා  මිදි යුෂ ගෙන දෙවියන් වහන්සේට ඔප්පු කළේ,
1. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ය.
2. ආරොන් ය.
3. ජෝෂුවා ය.
4. මෙල්කිසදෙක් ය.

(32) චතාරික සමය ආරම්භ වන්නේ,

1. අළු බදාදා ය.
2. ගොබ් ඉරිදා ය.
3. මහ සිකුරාදා ය
4. මහ බ්‍රහස්පතින්දා ය

(33) සාවුල්ට ප්‍රසාද ස්නාපනය දෙන ලද්දේ,

1. අනනියස් ය.
2. බර්ණබස් ය.
3. පේදුරු ය.
4. ස්නාවක ජොහාන් ය.

(34) ශුද්ධ වූ පාවුලුතුමාගේ හිස ගසා මරා දැමීමට නියම කළ අධිරාජයා වන්නේ,

1. අවුරේලියස් ය.
2. ට්‍රාජන් ය.
3. නීරෝ ය.
4. හෙරෝද් ඇන්ටියස් ය.

(35) සභාව ශුද්ධවන්ත වන්නේ,

1. ශුද්ධ වූ දේශය තුළ ආරම්භ වූ නිසාය.
2. ශුද්ධ බයිබලයේ සඳහන් වන නිසාය
3. විශ්වීයව ව්‍යාප්ත වූ නිසාය
4. ශුද්ධ වූ ත්‍රිත්වයට ඇති සම්බන්ධතාවය නිසාය.

(36) දෙවියන් වහන්සේට ප්‍රේම කිරීම යනු,

1. වෙනත් දෙවිවරු සොයා යාමය.
2. රූපවලට වන්දනා නොකිරීම.
3. මුළු හෘදයෙන් ද ආත්මයෙන් ද දෙවිඳුන්ට ප්‍රේම කිරීම
4. දේව මැව්ලිවලට වන්දනා කිරීම

(37) ''සිතා මතා ඉරුදින හා ණය මංගල දින දිව්‍ය පූජාවට සහභාගී නොවීම.''

1. පළමු පනතට විරුද්ධය.
2. දෙවන පනතට විරුද්ධය.
3. හතරවන පනතට විරුද්ධය.
4. තුන්වන පනතට විරුද්ධ ය.

(38) දිව්‍ය පූජාව මඟින්,

1. උත්ථානය සිහිකරයි.
2. කල්වාරි යාගය සිහිකරයි.
3. නැවත නැගිටීම සිහිකරයි.
4. පාපයෙන් ගලවා ගැනීම සිහිකරයි.

(39) ''යමෙකු තමාගේ මිතුරන් උදෙසා දිවි පිදීමට වඩා උතුම් ප්‍රේමයක් කිසිවකුට නැත.'' මෙය පවසන්නේ,

1. මැක්සිමිලියම් කෝල්බෙ මුනිතුමා
2. ජුසේවාස් පියතුමා
3. ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා
4. මර්සලින් ජයකොඩි පියතුමා

(40) ගරු කෝල්බෙ මුනිතුමා සතු මුද්‍රණාලය විසින් පළ කළ සඟරාව වන්නේ,

1. බලාපොරොත්තුවේ එළිපත්ත
2. අපෝස්තලික අනුශාසනා
3. සත්‍යය
4. දේව වේද ප්‍රශ්නය

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

(1)

i. ශුද්ධ බයිබලයෙහි ප්‍රධාන කර්තෘ සහ උපකර්තෘ ලියා දක්වන්න.
ii. ශුද්ධ බයිබලය ලියවුණු කාලවකවානුව ලියා දක්වන්න.
iii. බැබිලෝනියානු විප්‍රවාසයෙන් පසු ජුදා ජාතියේ සාමාජයීය හා ආගමික ප්‍රතිස්ථපනය පිළිබඳව සඳහන් කරන පොත් දෙක ලියන්න.
iv. ශු.පාවුළු තුමා හසුන් ලිවීමේ පරමාර්ථ දෙක ලියන්න.
v. එළිදරව්ව සඳහා යෙදෙන ග්‍රීක වචනයේ අර්ථය ලියන්න.
vi. බලාපොරොත්තුවට විරුද්ධ පාපයන් දෙක නම් කරන්න.
vii. පාස්කු අභිරහස යනු කුමක්ද ?
viii. මුල් කිතුනු සභාවේ ලක්ෂණ දෙකක් ලියන්න.
ix. පුරාණ ගිවිසුමේ දවන පූජ වර්ග දෙකක් ලියන්න.
x. මැක්සිමිලියන් කෝල්බෙ මුනිතුමා දුටු දර්ශනයේ ඔටුනු දෙකේ පාට ලියා ඒවායේ අර්ථයන් ලියන්න.

$(2\times 10 = 20)$

(2)

i. එළිදරව්ව සාහිත්‍යයේ දක්නට ලැබෙන සංකේත දෙකක් සඳහන් කරන්න. (ල.2)
ii. එළිදරව්ව සාහිත්‍ය යේ සංකේත ලෙස භාවිතා කරන වර්ණ තුනක් ලියා ඒවායේ අර්ථය ලියන්න.
iii. පේදුරුතුමා මෙන් නායකයකු ලෙස ක්‍රියා කිරීමට ඔබට කළ හැකි ආකාර 05 ක් විස්තර කරන්න. (ල.3)

(3)

i. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳ පූර්ව සලකුණු දෙකක් ලියන්න. (ල.2)
ii. දිව්‍ය පූජා යාගය සිදු කිරීමේ ප්‍රධාන අරමුණු තුනක් ලියන්න. (ල.3)

iii. දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනයෙන් පෝෂණය වන දරුවකු ලෙස ඔබ ක්‍රියා කරන අකාර පහක් විස්තර කරන්න. (ල.5)

(4)

i. ගෞරවනීය ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා විසින් රචිත ග්‍රන්ථ දෙකක් නම් කරන්න. (ල.2)
ii. ශුද්ධ වූ ජුසේවාස් පියතුමා විසින් සිදුකළ ප්‍රාතිහාර්යය 03 ක් දක්වන්න. (ල.3)
iii. නූතන සමාජයේ කතෝලික ජනතාවට මුහුණ පෑමට සිදුවන අභියෝග 05 ක් විස්තර කර දක්වන්න. (ල.5)

(5)

i. පළමු පනත සඳහා පදනම් වන කරුණු දෙකක් ලියන්න. (ල.2)
ii. දේව ප්‍රේමයට විරුද්ධ පාපයන් තුනක් ලියන්න. (ල.3)
iii. පළමු පනතට විරුද්ධ ක්‍රියා 05 ක් නම්කර ඒවා ජය ගැනීමට ක්‍රියාකරන ආකාරය විස්තර කරන්න. (ල.5)

(6)

i. ‘පේදුරු” යන්නෙහි අර්ථය ලියන්න. (ල.2)
ii. පේදුරු තුමාගේ මහා ප්‍රකාශය ලියන්න. (ල.3)
iii. දිවැසිවර කාර්යය ඉදිරියට ගෙනයාම සඳහා ඔබ ගන්නා ක්‍රියා මාර්ග 05 ක් විස්තර කර ලියන්න. (ල.5)

(7) පහත සඳහන් මාතෘකා දෙකක් තෝරාගෙන කෙටි සටහන් දෙකක් ලියන්න.

i. ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමා
ii. අති උතුම් ෆැන්සිස් ශුද්ධෝත්තම පියතුමා
iii. පොරොන්දු හා බාරහාර
iv. නව ගිවිසුමේ පාස්කු භෝජනය